# ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ප්‍රතිපත්තිය

එක්වත් නොහැර


ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

# ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ප්‍රතිපත්තිය

ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ
ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිය

© Jathika Jana Balawegaya (NPP)
2024

**විමසීම්:**
දුරකථනය -: +94112785612
ෆැක්ස් -: +94112786050
විද්‍යුත් තැපෑල -: contact@npp.lk
වෙබ් -: www.npp.lk

# ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිය

## හැඳින්වීම

සෑම පුද්ගලයෙකුම තම ජීවිතයේ යම් අවස්ථාවක, විශේෂයෙන් වයස්ගත වීමේදී සාමාන්‍ය ලෙස ක්‍රියා කිරීමේ දුෂ්කරතා අත්විඳීමට ඉඩ ඇත. පවුලේ සාමාජිකයකු ආබාධයක් සහිතව උපත ලබන විට, නැතහොත් ළමා වියේදී, නව යොවුන් වියේදී හෝ වැඩිහිටි වියේදී ආබාධ සහිත තත්වයට පත්වන විට වේදනාත්මක අවස්ථාවන් අත්විඳින්නට සිදුවේ. එබැවින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ජීවිත බලගැන්වීම සහ ඔවුන්ට සමාජයට පූර්ණ ලෙස සහභාගි විය හැකි පරිසරයක් සහතික කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ.

ආබාධිතභාවයේ ව්‍යාප්තිය පිරිමින්ට වඩා කාන්තාවන් තුළ සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී. විශේෂයෙන්ම දිළිඳු සමාජ ආර්ථික ස්ථර අතර සහ ග්‍රාමීය ප්‍රදේශවල ආබාධ සහිත පුද්ගලයන් ප්‍රමාණයෙන් වැඩි වන අතර නිසි පහසුකම්ද ඔවුනට නොලැබේ. ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 8.7% ක් පමණ ආබාධ සහිත පුද්ගලයන් වේ.

ශ්‍රී ලංකාව 2007 මාර්තු මස අත්සන් කරන ලද හා 2016 පෙබරවාරි මස පිළිගත් සහ අපරානුමත කරන ලද ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (CRPD) දක්වා ඇති පරිදි

ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ අභිමානය තහවුරු කිරීමේ වැදගත්කම හඳුනා ගනී. තවද ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා මානව හිමිකම් මූලික නිදහසෙන් වෙන් කළ නොහැකි, ඒකාග්‍ර සහ නොබෙදිය හැකි කොටසක් බව ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)ද තහවුරු කරයි.

ජාතික ජන බලවේගය ආබාධ සහිත ප්‍රජාවට රටේ අනෙකුත් පුරවැසියන් හා සමානව ජීවත් වීමට ඇති අයිතිවාසිකම, අධ්‍යාපනයට සහ වෘත්තීය අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම, රැකියාවක යෙදීමට ඇති අයිතිවාසිකම, ගමනාගමනයෙහි යෙදීමට ඇති අයිතිවාසිකම, රාජ්‍ය සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම ආදී වශයෙන් වූ සියලු අයිතිවාසිකම් පිළිගන්නා අතර එම අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග මෙම ප්‍රතිපත්තිය මගින් ඉදිරිපත් කෙරේ.

## දැක්ම

'ආබාධ සහිත පුද්ගලයින් ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් හා ඔවුන්ට සමානව සලකන අන්තර්කරණය වූ සමාජයක්'

## අරමුණු:

- ආබාධ සහිත පුද්ගලයින්ගේ මූල්‍ය ස්වාධීනත්වය, සහ ආර්ථික ස්වාධීනත්වය ශක්තිමත් කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට ජීවිතය සිය අවශ්‍යතා සපුරාගැනීමට අවැසි ප්‍රශස්ත සේවා සම්පාදනය කිරීම
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා අන්තර්කරණය සහ ප්‍රවේශතාවය තහවුරු වන අධ්‍යාපන අයිතිය ලබාදීම
- ආබාධ සහිත පුද්ගලයන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් සහතික කිරීම
- ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය කිරීම හා ඔවුන්ගේ සුබසිද්ධිය තහවුරු කිරීම සඳහා ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට (CRPD) අනුකූල වන ආකාරයට ප්‍රතිපත්ති ඵලදායි ලෙස ක්‍රියාත්මක වීම සහතික කිරීම

- ආබාධ සහිත පුද්ගලයන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම තහවුරු කිරීම
- ආබාධ සහිත පුද්ගලයන් අන්තර්ග්‍රාහී පොදු සේවාවන් සහ ප්‍රජා සහය සහතික කිරීම

## මූලධර්ම

- **ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට (CRPD) අනුකූල ව්‍යවස්ථාපිත නෛතික රාමුව:** ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට (CRPD) අදාළ ප්‍රමිතීන්ට අනුකූල වන ආකාරයට ආබාධිත බව පිළිබඳ සුවිශේෂීතාව සැලකිල්ලට ගැනීම, සමාන, සාධාරණ, සහ පූර්ණ වශයෙන් අයිතිවාසිකම් භුක්ති විඳීමේ අවකාශය සැලසීම සඳහා ආබාධ සහිත පුද්ගලයන්ගේ සහභාගිත්වයෙන් සැකසෙන නීති පද්ධතියක්
- **රාජ්‍ය යාන්ත්‍රණය:** ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය කරන රාජ්‍ය යාන්ත්‍රණයක් ස්ථාපිත කර එය විධායකය යටතට පත් කිරීම
- **තීරණ ගැනීමේ සහභාගිත්වය:** දේශපාලන, සමාජීය, සංස්කෘතික සහ ආර්ථික ක්ෂේත්‍රවල තීරණ ගැනීමේ ක්‍රියාවලීන්හි ආබාධ සහිත පුද්ගලයින්ගේ ක්‍රියාකාරිත්වය සහ සහභාගිත්වය
- **සම ප්‍රවේශ්‍යතාව:** ආබාධ සහිත පුද්ගලයන්ට ජීවිතයේ සෑම අංශයකදී ම පූර්ණව හා ස්වාධීන ව සහභාගි විය හැකි බව සහතික කෙරෙන, පොදු අවකාශයන්, යටිතල පහසුකම්,  තොරතුරු හා සන්නිවේදනයට ඇති පුළුල් ප්‍රවේශ්‍යතාව
- **සංවේදී සන්නිවේදනය:** අගතිගාමී සමාජ ඒකාකෘතිවල බලපෑමෙන් නිදහස්, සංවේදී සන්නිවේදනය මගින් ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ අවබෝධය පිළිගැනීම සහ අන්තර්කරණය ප්‍රවර්ධනය
- **හවුල්කාරීත්වය:** ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට හා අවශ්‍යතා සම්පාදනය කිරීමට විස්තීර්ණ සහ ප්‍රජාමූලික ප්‍රවේශයක් සහතික කරමින් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ ආබාධ සහිත පුද්ගලයින් නියෝජන කරන සංවිධානවල හවුල්කාරීත්වය

# ක්‍රියාමාර්ග

## ප්‍රශස්ත සේවා කළමනාකරණය සහ පාලනය

- ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධ පනත් අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම අවශ්‍ය නව නීති සම්පාදනය හා CRPD ඇතුළු සම්මුතීන් බලාත්මක කිරීම
- ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (CRPD) හි දක්වා ඇති මූලධර්ම හා වගකීම්වලට අනුකූල වන බව සහතික කරමින්, අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජාතික සැලැස්මක් සකසා ක්‍රියාත්මක කිරීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධ තීරණ ගැනීම සඳහා වන දෘශ්‍යමාන සහ ශක්තිමත් වගවීමේ ව්‍යුහයක් ස්ථාපිත කිරීම
- ජාතික සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික අයවැය තුළින් සහතික කිරීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන ජාතික උපායමාර්ගික සැලැස්ම ඔවුන් සමඟ ඵලදායී ලෙස සන්නිවේදනය සහතික කිරීම සඳහා විවිධ පාර්ශ්වකරුවන්ගෙන් සැදුම්ලත් කණ්ඩායම්වලින් ප්‍රතිපෝෂණ ලබා ගැනිම
- ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රතිපත්ති සහ සේවාවන් කෙතරම් ඵලදායිද යන්න මැන බැලීම සඳහා සියලුම රාජ්‍ය ආයතන සඳහා ඇගයීම් රාමුවක් හඳුන්වා දීම
- ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය කිරීම සඳහා බහු-ආංශික සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.
- ආබාධ සහිත සාමාජිකයින් සිටින පවුල්වලට රාජ්‍ය ප්‍රතිපත්ති සහ සේවාවන් වෙත ඇතුළු වීමටත්, අවශ්‍ය සම්පත් සහ තොරතුරු ලබා ගැනීමටත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි මාර්ගගත (Online) තොරතුරු මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට නවීන තාක්ෂණය භාවිත කිරීම සඳහා වඩාත් ඵලදායී දැනුවත් කිරීම, පුහුණු කිරීම සහ සහය සහතික කිරීම
- නිෂ්පාදන සංවර්ධනය කිරීමේදී ආබාධ සහිත පුද්ගලයින් සමඟ වැඩ

කිරීමට තාක්ෂණ අංශ දිරිමත් කිරීම

- ආබාධ සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා හා ගැටලු වඩා හොඳින් පූර්වාපේක්ෂණය කිරීම සහ ආබාධ සහිත වීම නිසා ඇතිවන ප්‍රතිඵල සහ බාධක වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම සඳහා පූර්ව දර්ශනය කිරීම සඳහා වන පර්යේෂණ ඒකකයක් පිහිටුවීම

## අධ්‍යාපනය සහ ඉගෙනීම

- උසස් තත්වයේ, දැරිය හැකි, අන්තර්කරණීය සහ පහසු ප්‍රවේශ්‍යතාව සහිත මුල් ළමාවිය අධ්‍යාපනයක් ලබාදීම සහ රැකවරණය සැපයීම
- දුබලයා පෙළීම් (bullying) හිරිහැර කිරීම් හෝ බැහැර කිරීම්වලින් තොර පරිසරයක් තුළ ආබාධ සහිත පාසල් සිසුන් සඳහා අන්තර්කරණීය අධ්‍යාපනය ලබා දීම
- ආබාධ සහිත පුද්ගලයන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා දැනුම, කුසලතා සහ ආකල්ප පිළිබිඹු කරන ගුරු පුහුණු විෂයමාලා සහ ගුරු වෘත්තීය නිපුණතා රාමුවක් සකස් කොට ක්‍රියාත්මක කිරීම
- සියලුම පාසල් ගුරුවරුන්, පාසල් නායකයින්, රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක වන පාසල් සහ පුහුණු මධ්‍යස්ථානයන්හි ගුරුවරුන් සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගෘහිත අධ්‍යාපනය පිළිබඳ දැනුම සහ අවබෝධය පුළුල් කිරීම
- සංඥා භාෂා පුහුණුව ලද ගුරුවරු පාසල් අධ්‍යාපනයට ඇතුළත් කිරීම සඳහා පහසුකම් සැපයීම
- සංඥා භාෂා අධ්‍යාපනය සහ සංඥා භාෂා පරිවර්තනය පිළිබඳ විශ්වවිද්‍යාල පාඨමාලාවන් හඳුන්වාදීම
- ශ්‍රව්‍ය ආබාධිත ප්‍රජාවගේ අවශ්‍යතා ඉටුකිරීමට සංඥා භාෂා පරිවර්තකයන් රාජ්‍ය හා පුද්ගලික ආයතන සඳහා යොමු කිරීමට පහසුකම් සැපයීම
- සෑම අධ්‍යාපන කොට්ඨාසයකම විශේෂ අධ්‍යාපන ළමා සංවර්ධන සම්පත් මධ්‍යස්ථානය බැගින් ස්ථාපිත කිරීම
- පාසල්වල සහ උසස් අධ්‍යාපන ආයතනවල විභාගවලට පෙනීසිටින ආබාධ සහිත සිසුන්ගේ සහාය සඳහා විශේෂ පහසුකම් සැපයීම

- ආබාධ සහිත ළමුන් සඳහා ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණ ඇතුළු අනෙකුත් පහසුකම් සැපයීම
- ආබාධ සහිත සිසුන් සඳහා පළාත් සහ ජාතික මට්ටමින් ක්‍රීඩා සහ විශේෂ විෂය බාහිර ක්‍රියාකාරකම් පැවැත්වීම
- ආබාධ සහිත සිසුන් සඳහා වසරකට අවම වශයෙන් එක් පාසල් අභ්‍යන්තර ක්‍රීඩා ඉසව්වක් සහ අන්තර් පාසල් ක්‍රීඩා ඉසව්වක් සංවිධානය කිරීම
- ආබාධ සහිත දරුවන්, පවුල් සහ ප්‍රජාවන් ඇතුළු වෘත්තිකයන්ට සහ වෙනත් අයට ආබාධිතතා සම්බන්ධ ඉගෙනුම් සහ වෘත්තීය සංවර්ධනය සඳහා පාඨමාලා පුළුල් කිරීම
- ලාභ නොලබන, ආබාධ සහිත පුද්ගලයින් සඳහා වන සත්කාර ආයතන සඳහා බදු සහන ලබා දීම සහ ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය සඳහා අධ්‍යාපනික පහසුකම් ලබා දීම
- තෘතීයික අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ප්‍රවේශය සහ සහභාගිත්වය වැඩිදියුණු කිරීම මගින් ආබාධ සහිත පුද්ගලයින්ට ඔවුන්ගේ සම්පූර්ණ විභවය සාක්ෂාත් කර ගැනීමට උපකාරී වීම
- ආබාධ සහිත ප්‍රජාව සමාජයේ ඵලදායී සාමාජිකයන් බවට පත්වීම සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කරමින් ඔවුන්ට ලබා ගත හැකි හොඳම වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය පිළිබඳ වෘත්තීය උපදේශන සහ මාර්ගෝපදේශ සේවා සැපයීම
- ජීවිත කාලය පුරාම ඉගෙනීම ලබා දීම සඳහා දැනුම ගොඩනැගීම, අත්පත් කර ගැනීම, නඩත්තු කිරීම සහ වර්ධනය කිරීම, සහ වැඩිහිටි හා ප්‍රජා අධ්‍යාපනය තුළින් වෘත්තීය දියුණුව සඳහා පහසුකම් සැලසීම

## රැකියා සහ මූල්‍ය සුරක්ෂිතභාවය

- සුදුසුකම් සපුරා ඇත්නම් සහ ආබාධිතතාව බාධාවක් නොවන පරිදි රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල රැකියාවලින් 5%ක් ආබාධ සහිත ප්‍රජාවට ලබාදීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- ආබාධ සහිත තරුණ තරුණියන් අධ්‍යාපනයේ සිට ක්‍රමානුකූලව සුදුසු රැකියාවට මාරුවීම සඳහා සංක්‍රාන්ති යාන්ත්‍රණයක් සකස් කිරීම

- ආබාධ සහිත පුද්ගලයින් සඳහා රැකියා අවස්ථා, ව්‍යාපාර හිමිකාරිත්වය සහ සංවර්ධනය, ස්වයං රැකියා සහ ව්‍යවසායකත්වය දිරිමත් කිරීම
- ආබාධ සහිත ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය, පවතින ව්‍යාපාර සහාය ලබා ගැනීම සහ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී ආබාධ සහිත පුද්ගලයින් මුහුණ දෙන අමතර අභියෝග පිළිබඳ දැනුම සහ අවබෝධය ලබාදීම
- ආබාධ සහිත පුද්ගලයින්ට සේවා ස්ථාන ගැලපුම් අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රතිචාරාත්මක සහ කාලෝචිත සහාය සහතික කිරීම, නම්‍යශීලී වැඩ සහ වැඩකරන වේලාවන් හඳුන්වාදීම දිරිමත් කිරීම, වෘත්තීය සෞඛ්‍ය සහ මානසික සෞඛ්‍ය තත්වයන් පිළිබඳ තොරතුරු සහ උපදෙස් සැපයීම
- ආබාධ සහිත වූවන්ට ආවේණික ගැටලු ගැන සන්නිවේදනය කිරීමට, තමන් පිළිබඳ  සංජානනය වෙනස් කර ගැනීමට හා අන්තර්කරණය දිරිමත් කිරීමට සේවාස්ථානවල ආබාධ සහිත වූවන්ගේ ජාල ශක්තිමත් කිරීම
- අඩු ආදායම්ලාභී ආබාධ සහිත පවුල් සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා මූල්‍ය ආධාර පුළුල් කිරීම
- පුහුණුව, උපදේශනය සහ පසු විපරම් කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් ඇතුළුව ආබාධ සහිත කාන්තාවන්ට උපකාර කිරීම සඳහා ආදායම් උත්පාදන යාන්ත්‍රණ සැපයීම

## සෞඛ්‍යය සහ යහපැවැත්ම

- ආබාධ සහිත පුද්ගලයින්ගේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අදාළ සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ වෘත්තීය නිපුණතා හා ආකල්ප ප්‍රවර්ධනය කිරීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා පොදු ස්ථාන හා සේවාවන්වල ප්‍රවේශ පහසුකම් පුළුල් කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට සෞඛ්‍ය සේවා සැපයීමේදී අදාළ පහසුකම් සහිත කවුන්ටර හඳුන්වාදීම සහ සංඥා භාෂාව සඳහා භෙදියන් පුහුණු කිරීම

- ආබාධිත සහ ආබාධිත වීමේ තත්වයන් වැළැක්වීම, කල් ඇතිව හඳුනා ගැනීම, රෝග විනිශ්චය සහ ප්‍රතිකාර කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ ආබාධ සහිත පුද්ගලයින් සහ පවුලේ සාමාජිකයින් සඳහා අවශ්‍ය යොමු කිරීම් සහ උපදේශන සඳහා ඵලදායී වෛද්‍ය මැදිහත්වීම් ලබා දීම
- ආබාධ සහිත පුද්ගලයින් මුහුණ දෙන සෞඛ්‍ය අසමානතා අවම කිරීම සඳහා සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලයට බුද්ධිමය ආබාධ සහ ඕටිසම් අතර වෙනස අවබෝධ කරගැනීමට අවශ්‍ය දැනුම ලබා දීම
- ඔටිසම් සහ අනෙකුත් සංවර්ධන ආබාධ කල්තියා හඳුනා ගැනීම සහ වර්ධනය අවම කිරීමට මැදිහත්වීම සඳහා සෞඛ්‍ය සේවා පහසුකම් වැඩිදියුණු කිරීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා සුදුසු, ඵලදායී සහ ප්‍රවේශ විය හැකි මානසික සෞඛ්‍ය සහය සහ සේවාවන් සැපයීම
- ආබාධ සහිත පුද්ගලයින් හඳුනාගැනීමට මෙන්ම, සේවා ආයතනවලට ප්‍රවේශවීමේ පහසුකම සපයන ප්‍රමුඛතා කාඩ්පතක් නිකුත් කිරීම
- අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත පුද්ගලයින්ගේ ශල්‍යකර්ම සහ ඖෂධ සඳහා මූල්‍ය ආධාර ලබා දීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා මහජන සෞඛ්‍ය තොරතුරු, සෞඛ්‍ය සේවා, ඖෂධ, සහ අනෙකුත් අත්‍යවශ්‍ය දෑ වෙත පහසුවෙන් ප්‍රවේශවීමේ හැකියාව ඇතුළු අන්තර්කරණය සහතික කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට සෞඛ්‍ය සේවා සැපයීමේදී හදිසි අවස්ථා සැලසුම් කිරීම සහ සූදානම් කිරීම,  අමතර සහාය ලබා දීම, ඉවත් කිරීම හෝ ශාරීරික හුදකලා වීමකදී අමතර සහය සහ සුදුසු සහය ලබාදීම සහ සුවවීමේ ක්‍රියාවලිය සඳහා සහය වීම
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රදේශ මට්ටමින් සහ දිස්ත්‍රික් මට්ටමින් පුනරුත්ථාපන රෝහල් ඔස්සේ ප්‍රජා මූලික පුනරුත්ථාපන සේවා ප්‍රවර්ධනය කිරීම
- ආබාධ සහිත පුද්ගලයින් රැකබලා ගැනීම සඳහා සෞඛ්‍ය සහ සමාජ සත්කාර සඳහා ආබාධිත තත්ත්ව දත්ත සහ සාක්ෂි භාවිතය වැඩි දියුණු කිරීම

## ආරක්ෂාව, අයිතිවාසිකම් සහ යුක්තිය

- ආබාධ සහිත පුද්ගලයින්ට සමාජයීය ජීවිතයක් ගතකිරීමට ඇති බාධක ඉවත් කිරීම සඳහා නීති ගෙන ඒම
- රජයේ පත්වීම් සඳහා අයදුම් කිරීමට ආබාධ සහිත පුද්ගලයින් දිරිමත් කිරීම සහ ඔවුන්ට අයදුම් කිරීමේ ක්‍රියාවලිය පහසු කිරීම
- පොදු ප්‍රවාහනයේදී ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ප්‍රවාහන කාර්ය මණ්ඩලය ඇතුළු මහජනතාවගේ සාධනීය ආකල්ප ප්‍රවර්ධනය කිරීම
- ආබාධ සහිත පුද්ගලයන්ට අවශ්‍ය නීති තොරතුරු සැපයීම මගින් අධිකරණයේ හා නීතියේ සහය සඳහා වන ප්‍රවේශ්‍යතාව වර්ධනය කිරීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සහ ආබාධ සහිත පුද්ගලයින්ට එරෙහි අපරාධ මැඩලීමට වින්දිතයින්ට සහ සාක්ෂිකරුවන්ට සහාය වීම
- ආබාධිත ප්‍රජාවට සිදුවන ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිටු දැකීම
- ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් කිරීම සහ ගරු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ආබාධ සහිත පුද්ගලයින් සඳහා අයිතිවාසිකම් කේන්ද්‍ර කරගත් ව්‍යවස්ථාපිත ආරක්ෂණයන් ගොඩනැගීම

## පුද්ගලික සහ ප්‍රජා සහාය

- සමාජ සත්කාර ප්‍රතිසංස්කරණවල සෑම අදියරකදීම ආබාධ සහිත පුද්ගලයින් සහ ආබාධිත සංවිධාන සමඟ ඔවුන්ගේ හඬට සවන් දීම සහ ඔවුන්ගේ අවශ්‍යතා පිළිබිඹු කිරීම සහතික කිරීම.
- මාර්ගගත පොදු සේවාවන්හි ප්‍රවේශ්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට උපකාරක සහ ප්‍රවේශ තාක්ෂණයන් සංවර්ධනය කිරීම හා අදාළ නවෝත්පාදන දිරිමත් කිරීම
- ශ්‍රවණ ආබාධ සහිත පුද්ගලයින් භාවිත කරන ආධාරක උපාංග නිෂ්පාදනය සහ ආනයනය සඳහා රජය මැදිහත් වීම හා අවශ්‍ය පරිදි බදු සහන ලබාදීම

- විවිධ ආබාධ සහිත පුද්ගලයින්ගේ පහසුව සඳහා ශ්‍රව්‍ය මාර්ග සංඥා සහ ස්වයංක්‍රීය දෘශ්‍ය දර්ශක පද්ධති සැපයීම
- ශ්‍රවණ ආබාධ සහිත පුද්ගලයන් සඳහා සංඥා භාෂාව සන්නිවේදන භාෂාව ලෙස පිළිගැනීම
- ආබාධ සහිත පුද්ගලයින් සඳහා පොදු වැසිකිළි, ප්‍රසංග, ක්‍රීඩා පිටි, පාසල්, ව්‍යායාම් ශාලා සහ පිහිනුම් තටාක වැනි පොදු පහසුකම් සඳහා වැඩි ප්‍රවේශ්‍යතාවක් සහතික කිරීම
- සංවිධිත ක්‍රීඩා, ශාරීරික ක්‍රියාකාරකම් ව්‍යායාම සඳහා උපකරණ ඇතුළු සියලුම ආබාධවලට සරිලන මාර්ග සහ රථගාල්වල ආබාධ සහිත පුද්ගලයින් අන්තර්කරණය සඳහා පහසුකම් සැපයීම
- ක්‍රීඩාවන්වලට ප්‍රවේශ වන අඩු ආදායම්ලාභී පවුල්වල ආබාධ සහිත පුද්ගලයින් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම
- ආබාධ සහිත පුද්ගලයින්ගේ කලා සහ සංස්කෘතික සහභාගීත්වය පුළුල් කිරීමට අදාල රංග ශාලා හා ක්‍රීඩා පිටි වැනි ස්ථාන වඩා අන්තර්කරණීය කිරීම
- ප්‍රවේශ්‍යතා රෙගුලාසිවලට අනුකූල නොවන ස්ථානවලට එරෙහිව පැමිණිලි භාර ගැනීමට සහ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යාන්ත්‍රණයක් ඇති කිරීම
- අන්තර්කරණීය සමාජයක් සාක්ෂාත් කර ගැනීමට ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ප්‍රජා ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් හඳුන්වාදීම
- ජීවන තත්වය වැඩිදියුණු කිරීම සහ අසමානතා අවම කිරීම සඳහා ආබාධ සහිත පුද්ගලයන් මුහුණ දෙන අපකීර්තියට හා වෙනස්කම්වලට භාජනය වීමට එරෙහි ක්‍රියාමාර්ග ගැනීම
- නායකත්ව භූමිකාවන්හි ආබාධ සහිත පුද්ගලයින්ගේ නියෝජනය වැඩි කිරීම

## අන්තර්කරණීය නිවාස සහ ප්‍රජාවන්

- ආබාධ සහිත පුද්ගලයන් සඳහා දැරිය හැකි මිලකට නිවාස ලබා ගැනීමේ පහසුකම් වැඩි කිරීම සහ නව නිවාස සඳහා ප්‍රවේශ්‍යතා ප්‍රමිතීන් ඉහළ නැංවීම
- පොදු ගොඩනැගිලි සැලසුම්කරණයේදී ආබාධ සහිත පුද්ගලයින්ගේ ආරක්ෂාව සහතික කිරීම
- ආබාධ සහිත පුද්ගලයින්ට සමාජීය, විනෝදාත්මක, ක්‍රීඩා, ආගමික සහ සංස්කෘතික ජීවිතයට සහභාගී වීම ඇතුළු කටයුතුවලට සම්බන්ධ වීමට ඇති අවස්ථා පුළුල් කිරීම
- විශ්වීය අන්තර්කරණ මූලධර්ම අනුගමනය කරමින් ආබාධ සහිත ප්‍රජාවට ගොඩනැගිලි, ප්‍රවාහනය, උද්‍යාන සහ ක්‍රීඩා පිටි භාවිත කිරීමට අවස්ථාව සලසා දීම
- ආබාධ සහිත පුද්ගලයින්ට පොදු සහ පෞද්ගලික ප්‍රවාහනය භාවිත කිරීම පහසු කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුන්වාදීම හා විශේෂිත ප්‍රවාහන සේවා සැපයීම

ජාතික ජන බලවේගය ආබාධ සහිත ප්‍රජාවට රටේ අනෙකුත් පුරවැසියන් හා සමානව ජීවත් වීමට ඇති අයිතිවාසිකම, අධ්‍යාපනයට සහ වෘත්තීය අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම, රැකියාවක යෙදීමට ඇති අයිතිවාසිකම, ගමනාගමනයෙහි යෙදීමට ඇති අයිතිවාසිකම, රාජ්‍ය සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම ආදී වශයෙන් වූ සියලු අයිතිවාසිකම් පිළිගන්නා අතර එම අයිතිවාසිකම් සහතික කිරීම සඳහා ප්‍රායෝගික ක්‍රියාමාර්ග මෙම ප්‍රතිපත්තිය මගින් ඉදිරිපත් කෙරේ.


ජාතික ජන බලවේගය
தேசிய மக்கள் சக்தி
JATHIKA JANA BALAWEGAYA (NPP)

464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

akd.lk